එන්නතක් හේතුවෙන් ඇති වූ බව කියන සංකූලතාවයක් මත පේරාදෙණිය රෝහලේදී තරුණියක් මිය යෑමේ සිදුවීම පසුගිය දවස් කීපයේදී මාධ්‍ය තුළ ඉහළ අවධානයක් දිනාගෙන තිබුණි. එම සිදුවීම සම්බන්ධ වාතර්‍ාකරණය සමගින්, ශ්‍රී ලංකාවට ගෙන්වන ඖෂධවල ප්‍රමිතිය සම්බන්ධයෙන් ද කරුණු සඳහන් විණි.
මේ සම්බන්ධයෙන්, රූපවාහිනී රාත්‍රී ප්‍රධාන ප්‍රවෘත්ති විකාශයන්හි වාතර්‍ාකරණයන් ඔස්සේ, මියගිය තරුණියගේ දේහය අවසන් ගෞරව සඳහා තැන්පත් කර තිබියදී එක් එක් නාලිකා ඔස්සේ පෙන්වා තිබූ ආකාරය, පහත පරිදි දැක්විය හැක.
මෙහිදී ඇතැම් නාලිකාවන් මෘත දේහය පෙන්වූවද, එහි මුහුණ ආවරණය කර පෙන්වීමට උත්සුක වී තිබිණි.
තවත් නාලිකාවන් මුහුණ ආවරණය කිරීමක් නොමැතිව මෘත දේහය පෙන්වා තිබිණි.
ඔබ සිතන අන්දමට,
1) මියගිය අයගේ දේහය පෙන්වීම සඳහා පවුලේ අයගෙන් අවසර ලබාගෙන තිබේ ද?
2) මියගිය අයෙකුගේ දේහයක් ප්‍රවෘත්ති වාතර්‍ාකරණයන් ඔස්සේ මෙසේ පෙන්විය යුතුද? එක කෙතරම් අත්‍යාවශ්‍යයැයි ඔබ සිතන්නේද?
3) මියගිය අයගේ පවුලේ අයගේ සිත් වේදනාවන් මෙවැනි අත්දැකීමකට මුහුණ දුන් අයෙකුගේ සිත් වේදනාවන් සහ කම්පනය තීව්‍ර වීමට ද හේතු වෙතැයි ඔබ සිතන්නේද?
(YouTube වෙත එක්කොට තිබූ, ජූලි 13 සහ 14, 2023 දිනයන්හි රූපවාහිනී රාත්‍රී ප්‍රධාන පුවත් විකාශයන් ඇසුරිණි.)
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධමර් කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!